# දළ දේශීය නිෂ්පාදිතය
## 2021 වර්ෂයේ දෙවන කාර්තුව - නිෂ්පාදන ප්‍රවේශය
### පදනම් වර්ෂය 2010

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2021 වර්ෂයේ දෙවන කාර්තුව (අප්‍රේල් 01 සිට ජුනි 30 දක්වා) සඳහා පවත්නා මිල ගණන් සහ ස්ථාවර මිල ගණන් (2010) යටතේ දළ දේශීය නිෂ්පාදිතය සහ අනෙකුත් සාර්ව ආර්ථික දර්ශක ඇස්තමේන්තු කොට නිකුත් කර ඇත.

ඒ අනුව 2021 වර්ෂයේ දෙවන කාර්තුවේ ඇස්තමේන්තු ගත දළ දේශීය නිෂ්පාදිතය පවත්නා මිල ගණන් යටතේ රුපියල් මිලියන 3,626,482ක් සහ ස්ථාවර මිල ගණන් යටතේ රුපියල් මිලියන 2,170,052 ක් ලෙස වාර්තා වේ. 2020 වර්ෂයේ දෙවන කාර්තුව සඳහා මෙම වටිනාකම් පිළිවෙලින් රුපියල් මිලියන 3,007,345 ක් සහ රුපියල් මිලියන 1,932,319 ක් වශයෙන් වාර්තා විය.

- 2021 වර්ෂයේ දෙවන කාර්තුවේ දී ශ්‍රී ලංකා ආර්ථිකය සියයට 12.3ක ධන වර්ධනයක් වාර්තා කර ඇති අතර පෙර වර්ෂයේ දෙවන කාර්තුවේ දී මෙම වර්ධනය සටහන් වුයේ සියයට 16.4 ක ඍණ වර්ධනයක් වශයෙනි.
- 2020 වර්ෂයේ දෙවන කාර්තුවට සාපේක්ෂව 2021 වර්ෂයේ දෙවන කාර්තුවේ දී කෘෂිකාර්මික ආර්ථික කටයුතු සියයට 8.1ක්, කර්මාන්ත ආර්ථික කටයුතු සියයට 22.1ක් සහ සේවා ආර්ථික කටයුතු සියයට 7.5 ක් වශයෙන් ධන වර්ධන වේගයන් වාර්තා කර ඇත.
- 2021 වර්ෂයේ දෙවන කාර්තුවේ දළ දේශීය නිෂ්පාදිතය සඳහා කෘෂිකර්මාන්ත ආර්ථික කටයුතු, කර්මාන්ත ආර්ථික කටයුතු, සේවා ආර්ථික කටයුතු සහ භාණ්ඩ හා සේවා මත අයකෙරෙන සහනාධාර අඩුකළ බදු පිළිවෙලින් සියයට 9.2ක්, සියයට 27.0ක්, සියයට 57.9ක් සහ සියයට 5.8ක් වශයෙන් දායකත්වය ලබා දී ඇත.

අන්තර්ගතය
2021 දෙවන කාර්තුවේ ආර්ථිකයේ සාමාන්‍ය හැසිරීම - පිටුව 2
කෘෂිකාර්මික ආර්ථික කටයුතුවල වර්ධනයන් - පිටුව 6
කර්මාන්ත ආර්ථික කටයුතුවල වර්ධනයන් - පිටුව 8
සේවා ආර්ථික කටයුතුවල වර්ධනයන් - පිටුව 10

Source Publication

http://www.statistics.gov.lk/NationalAccounts/StaticalInformation/Detail_Note/Second Quarter 2021_si

## 1.0 2021 වර්ෂයේ දෙවන කාර්තුවේ ආර්ථිකයේ හැසිරීම

ශ්‍රී ලංකා ආර්ථිකය 2020 වසරේ දෙවන කාර්තුව හා සසඳන විට 2021 වසරේ දෙවන කාර්තුවේ දී 2021 අප්‍රේල් මස අවසානයේ කොවිඩ් -19 වසංගතයේ තුන්වන රැල්ල ආරම්භ වන තුරු සතුටුදායක මට්ටමක පැවතිණි. කොවිඩ් -19 වසංගතය පාලනය කිරීම සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග යටතේ වුව ද මෙවර සිංහල හා දෙමළ අලුත් අවුරුදු උත්සවය සැමරීමට ශ්‍රී ලාංකික ප්‍රජාවට හැකි විය. ව්‍යාපාරික කටයුතු සීමා කිරීම, සංචරණ සීමා , සෞඛ්‍ය පූර්වාරක්ෂක විධි වැනි දීර්ඝ සීමා පැනවීමකට මුහුණ දී සිටි ජන සමාජයට ලැබුණු මෙම සහනයේ ප්‍රතිඵලයක් ලෙස විශේෂයෙන් අප්‍රේල් මාසයේදී, විදේශ සංචාරකයින් පැමිණීම හා සම්බන්ධ ව්‍යාපාර හා විනෝදාස්වාද ආශ්‍රිත ව්‍යාපාර හා සංස්කෘතික කටයුතු වැනි ඉතා සුළු කටයුතු ප්‍රමාණයක් හැරුණු විට බොහෝ ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාම කෙරෙහි සතුටුදායක ලෙස බලපෑවේය.

සිංහල අලුත් අවුරුදු උත්සවය නිමා වූ විගස, අප්‍රේල් මාසය අවසානයේ දිවයිනේ සෑම දිස්ත්‍රික්කයකින්ම කොවිඩ් -19 ආසාධිත රෝගීන් සංඛ්‍යාව වැඩිවීමත් සමග කොවිඩ්-19 වසංගතයේ තුන්වන රැල්ල සක්‍රිය විය. මෙම කොවිඩ් -19 වසංගතය සහ එහි ඩෙල්ටා නව ප්‍රභේදය දිවයින පුරා සීඝ්‍රයෙන් ව්‍යාප්ත වීම හේතුවෙන්, එය පැතිරීම වැළැක්වීම සඳහා රජය විසින් මැයි 21 දා සිට මාසයක පමණ කාලයක් සඳහා නැවත දිවයිනම ආවරණය වන පරිදි සංචරණ සීමා පැනවීමට තීරණය කරන ලදී. කෙසේ වෙතත් 2020 වර්ෂයේ අගුළු දැමීමේ ස්වභාවය හා සසඳන විට මෙම තත්වය පසුගිය වසරේ රට සම්පූර්ණයෙන්ම පාහේ අගුළු දැමීමේ ක්‍රියාවලිය තරම් දැඩි නොවීය. සියලුම කෘෂිකර්මාන්ත ආශ්‍රිත කටයුතු, බොහෝ නිෂ්පාදන කර්මාන්ත කටයුතු, ඉදිකිරීම් කටයුතු සහ සේවා ආශ්‍රිත බොහෝ ව්‍යාපාර කටයුතු සඳහා මෙම සංචරණ සීමා කාලය තුළදීත් සිය කාර්යයන් අඛණ්ඩව කරගෙන යාමට රජය අවසර ලබාදෙන ලදී. මෙම තත්ත්වය 2021 වර්ෂයේ දෙවන කාර්තුවේ දී ව්‍යාපාර කටයුතු සිදු කරගෙන යාම කෙරෙහි වාසිදායක වාතාවරණයක් නිර්මාණය කළ අතර එහි ප්‍රතිඵලයක් ලෙස බොහෝ ආර්ථික හා නිෂ්පාදන කටයුතු වල 2020 දෙවන කාර්තුවට සාපේක්ෂව ඉහළ නැගීමක් වාර්තා වී ඇත.

2020 වර්ෂයේ දෙවන කාර්තුවේ දී ශ්‍රී ලංකා ආර්ථිකය කෝවිඩ්-19 වසංගතයේ දරුණු බලපෑමට ලක්වූ අතර එහිදි රට මුළුමනින් ම පාහේ මාසයක පමණ කාලයක් පූර්ණ අගුළු දැමීමකට ලක්විය. එහි ප්‍රතිඵලයක් ලෙස ආර්ථිකයේ බොහෝ නිෂ්පාදන කටයුතු සෘණ වර්ධන වේගයන් වාර්තා කරන ලද අතර එහි දී සමස්ත දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගය සියයට 16.4 ක සෘණ වර්ධන වේගයක් වශයෙන් වාර්තා විය. එය ශ්‍රී ලංකා ආර්ථිකයේ මෙතෙක් වාර්තා වූ විශාලතම සෘණ ආර්ථික වර්ධන වේගය වශයෙන් වාර්තා විය.

2020 වර්ෂයේ දෙවන කාර්තුවේ දළ දේශීය නිෂ්පාදිත ඇස්තමේන්තු අනුව මූර්ත දළ දේශීය නිෂ්පාදිතය 2019 වර්ෂයේ දෙවන කාර්තුවේ දී වාර්තා වූ රුපියල් මිලියන 2,312,528 සිට 2020 දෙවන කාර්තුවේ දී රුපියල් මිලියන 1,932,319 දක්වා අඩුවිය. ඒ අනුව 2021 වර්ෂයේ දෙවන කාර්තුවේ ආර්ථික වර්ධන වේගය ගණනය කරනු ලබන්නේ එසේ පහළ ගිය 2020 වර්ෂයේ දෙවන කාර්තුවේ දළ දේශීය නිෂ්පාදිතයේ වටිනාකමට සාපේක්ෂවයි.

ඒ අනුව මූර්ත දළ දේශීය නිෂ්පාදිතය 2020 වර්ෂයේ දෙවන කාර්තුවේ දී වාර්තා වූ රුපියල් මිලියන 1,932,319 සිට රුපියල් මිලියන 2,170,052 දක්වා 2021 වර්ෂයේ දෙවන කාර්තුවේ දී වැඩිවී ඇති නමුත් රූප සටහන 1 මගින් පෙන්නුම් කෙරෙන පරිදි එම වටිනාකම තවමත් 2019 වර්ෂයේ දෙවන කාර්තුවේ දී වාර්තා වූ මූර්ත දළ දේශීය නිෂ්පාදිතයට වඩා අඩු අගයක පැවතීමෙන් පෙන්නුම් කෙරෙන්නේ ආර්ථිකය තවදුරටත් යථා තත්ත්වයට පත්වෙමින් පවතින බවයි.

මෙම තත්ත්වයන් යටතේ 2021 වර්ෂයේ දෙවන කාර්තුවේ දී ආර්ථිකය සියයට 12.3ක ධන වර්ධන වේගයක් වාර්තා කර ඇති අතර එය 2020 වර්ෂයේ දෙවන කාර්තුවේ දී සටහන් වුයේ සියයට 16.4ක සෘණ වර්ධන වේගයක් වශයෙනි.

රූප සටහන 1 - දෙවන කාර්තුවේ මූර්ත දළ දේශීය නිෂ්පාදිතය 2018-2021




තව ද පවත්නා මිල ගණන් යටතේ දළ දේශීය නිෂ්පාදිතය 2020 වර්ෂයේ දෙවන කාර්තුවේ දී රුපියල් මිලියන 3,007,345 ක් ලෙස වාර්තා වන අතර එය 2021 වර්ෂයේ දෙවන කාර්තුවේ දී රුපියල් මිලියන 3,626,482 ක් ලෙස වාර්තා විය. ඒ අනුව පවත්නා මිල ගණන් යටතේ දළ දේශීය නිෂ්පාදිතය 2021 වර්ෂයේ දෙවන කාර්තුවේ දී සියයට 20.6ක වැඩිවීමක් වාර්තා කර ඇත.

ආර්ථිකයේ කෘෂිකර්මාන්ත, කර්මාන්ත හා සේවා යන සංරචක ත්‍රිත්වය 2020 වර්ෂයේ දෙවන කාර්තුවේ දී වාර්තා කළ පසුබැසීම් වලට සාපේක්ෂව 2021 වර්ෂයේ දෙවන කාර්තුවේ දී පිළිවෙලින් සියයට 8.1ක්, සියයට 22.1ක් සහ සියයට 7.5ක් වශයෙන් ඉහළ ධන වර්ධන වේගයන් වාර්තා කර ඇත.

ආර්ථිකයේ ප්‍රධාන සංරචක හතර වන “කෘෂිකර්මාන්ත”, “කර්මාන්ත”, “සේවා” සහ “භාණ්ඩ මත අය කෙරෙන සහනාධාර අඩු කළ බදු” 2021 වර්ෂයේ දෙවන කාර්තුවේ පවත්නා මිල ගණන් යටතේ දළ දේශීය නිෂ්පාදිතයට දක්වනු ලබන දායකත්වයන් පිළිවෙලින් සියයට 9.2 ක්, සියයට 27.0 ක්, සියයට 57.9 ක් සහ සියයට 5.8 ක් ලෙස වාර්තා වේ.

රූප සටහන 2 - දෙවන කාර්තුවේ වර්ධනයන් 2020 සහ 2021



කෘෂිකර්මාන්ත ආර්ථික කටයුතු අතුරෙන් 2021 වර්ෂයේ දෙවන කාර්තුවේ දී 'කරදිය ධිවර කටයුතු' (සියයට 24.7), 'සත්ව නිෂ්පාදනය'(සියයට 18.0), 'රබර් වගා කිරීම' (සියයට 15.7) වශයෙන් කැපී පෙනෙන ධන වර්ධන වේගයන් වාර්තා කර ඇත. තව ද 'පොල් ඇතුලත් තෙල් සහිත පළතුරු බෝග වගාව' (සියයට 14.0), 'තේ වගා කිරීම'(සියයට 13.4), 'පැළ බෝකිරීම සහ කෘෂිකාර්මික සහය සේවා'(සියයට 12.3), 'මිරිදිය ධිවර කටයුතු' (සියයට 7.6) 'ධාන්‍ය වගා කිරීම'(සියයට 6.6), 'පළතුරු වගා කිරීම' (සියයට 6.5), 'කුළු බඩු වගා කිරීම' (සියයට 4.7), 'වන වගා සහ දැව කදන් නිෂ්පාදනය' (සියයට 4.2) වශයෙන් සැළකිය යුතු ධන වර්ධන වේගයන් වාර්තා කර ඇත. එහිදී 'වී වගා කිරීම'(සියයට 5.1), 'එළවළු වගා කිරීම' (සියයට 4.5) සහ 'අනෙකුත් ස්ථාවර බෝග වගා කිරීම'(සියයට 4.3) වශයෙන් ඍණ වර්ධන වේගයන් වාර්තා කර ඇත.

2021 වර්ෂයේ දෙවන කාර්තුවේ දී කර්මාන්ත ආර්ථික කටයුතු සමස්තයක් වශයෙන් සියයට 22.1ක සැළකිය යුතු ධන වර්ධන වේගයක් වාර්තා කර ඇති අතර කෙසේ වෙතත් එහිදි කර්මාන්ත ආර්ථික කටයුතු වල සමස්ත එකතුකළ අගය 2019 වර්ෂයේ වාර්තා වූ මට්ටම කරා තවමත් ලගා වී නොමැති අතර මෙම වර්ධනය මූලික වශයෙන් ම 2020 වර්ෂයේ දෙවන කාර්තුවේ පැවති පසුබැසීම මත පදනම් වී ඇති බව පෙනේ.

2021 වර්ෂයේ දෙවන කාර්තුවේ දී 'නිමැවුම් කර්මාන්ත කටයුතු' සමස්තයක් වශයෙන් සියයට 26.5 ක වර්ධනයක් වාර්තා කර ඇත. නිමැවුම් කර්මාන්ත කටයුතු අතුරෙන් 'මූලික ලෝහ සහ ව්‍යුවහාත්මක ලෝහ නිෂ්පාදන' (සියයට 74.5), 'රබර් හා ප්ලාස්ටික් නිෂ්පාදන'(සියයට 66.8), 'රෙදිපිළි, ඇගළුම් හා සම්භාණ්ඩ නිෂ්පාදන'(සියයට 60.7), 'ගෘහ භාණ්ඩ නිෂ්පාදන'(සියයට 54.4), 'යන්ත්‍රසූත්‍ර සහ උපකරණ නිෂ්පාදන'(සියයට 47.8), 'අනෙකුත් ලෝහ නොවන ඛනිජ නිෂ්පාදන'(සියයට 41.3), 'දැව හා දැවමය නිෂ්පාදන(ගෘහ භාණ්ඩ හැර)'(සියයට 32.0), 'කඩදාසි නිෂ්පාදන'(සියයට 28.1) සහ 'අනෙකුත් නිෂ්පාදන කර්මාන්ත'(සියයට 28.1) වශයෙන් සැළකිය යුතු ධන වර්ධන වේගයන් වාර්තා කර ඇත. තව ද 'රසායනික ද්‍රව්‍ය සහ මූලික ඖෂධ නිෂ්පාදන'(සියයට 13.0) සහ 'පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදන'(සියයට 12.7) වශයෙන් ධන වර්ධන වේගයන් වාර්තා කර ඇති අතර නිමැවුම් කර්මාන්ත ආර්ථික කටයුතු අතුරෙන් දළ දේශීය නිෂ්පාදිතයට ඉහළ ම දායකත්වය සහිත ' ආහාර පාන සහ දුම්කොළ නිෂ්පාදන' සියයට 5.4 ක ධන වර්ධනයක් 2021 වර්ෂයේ දෙවන කාර්තුවේ දී වාර්තා කර ඇත.

කර්මාන්ත ආර්ථික කටයුතු යටතේ ගැනෙන 'විදුලිය'(සියයට 12.8), 'ජලය එක්රැස්කිරීම,පිරිසිදුකිරීම සහ බෙදාහැරීම '(සියයට 3.2) වශයෙන් ධන වර්ධන වේගයන් වාර්තා කර ඇති අතර 'ඉදිකිරීම් කර්මාන්ත කටයුතු'(සියයට 18.2) සහ 'පතල් හා කැනීම් කටයුතු'(සියයට 17.9) වශයෙන් සැලකිය යුතු ධන වර්ධන වේගයන් වාර්තා කර ඇත. එහිදි 'මලාප්‍රවාහන සහ කසල බැහැර කිරීමේ කටයුතු' තවදුරටත් සියයට 5.7 ඍණ වර්ධන වේගයක් 2021 වර්ෂයේ දෙවන කාර්තුවේ දී වාර්තා කර ඇත.

2021 වර්ෂයේ දෙවන කාර්තුවේ දී සේවා ආර්ථික කටයුතු ද සියයට 7.5 ක ධන වර්ධන වේගයක් වාර්තා කර ඇත. එහි දී මෙම වර්ධනය කෙරෙහි 'තොරතුරු තාක්ෂණ සේවා'(සියයට 24.2), 'ප්‍රවාහන සේවා සැපයීම'(සියයට 20.4), 'විදුලි සංදේශ සේවා'(සියයට 19.6), 'රක්ෂණ සේවා'(සියයට 14.4) සහ 'මූල්‍ය සේවා'(සියයට 14.3) ක ධන වර්ධන වේගයන් වාර්තා කරමින් දායක වී ඇත. තව ද ' දේපොළ වෙළදාම් '(සියයට 5.5), 'වෘත්තීය සේවා'(සියයට 3.4), 'අනෙකුත් පෞද්ගලික සේවා'(සියයට 2.6) සහ 'තොග හා සිල්ලර වෙළදාම'(සියයට 1.0) වශයෙන් ධන වර්ධන වේගයන් වාර්තා කර ඇත.

එහිදි 2020 වර්ෂයේ දෙවන කාර්තුවේ දී සියයට 63.6ක පසුබැසීමක් වාර්තා වූ ' ආහාරපාන සහ නවාතැන් පහසුකම් සැපයීම' සේවා ආර්ථික කටයුත්ත සියයට 42.6ක වර්ධනයක් 2021 වර්ෂයේ දෙවන කාර්තුවේ දී වාර්තා කර ඇති අතර මෙම වර්ධනය මූලික වශයෙන්ම පෙර වර්ෂයේ වාර්තා වූ පසුබැසීම මත පදනම් වී ඇත.

කිසියම් වර්ෂයක ස්ථාවර මිල ගණන් යටතේ ගණනය කර ඇති දළ දේශීය නිෂ්පාදිතය හා පවත්නා මිල ගණන් යටතේ ගණනය කර ඇති දළ දේශීය නිෂ්පාදිතය අතර අනුපාතය දළ දේශීය නිෂ්පාදිතයේ ගම්‍ය මිල අවධමනකය වේ. එහි අගය

2020 වර්ෂයේ දෙවන කාර්තුවේ දී 155.63 ක් (2010=100) ලෙස වාර්තා වන අතර 2021 වර්ෂයේ දෙවන කාර්තුවේ දී 167.11 ක් ලෙස වාර්තා විය. ඒ අනුව දළ දේශය නිෂ්පාදිතයේ ගම්‍ය මිල අවධමනකයට අනුව 2021 වර්ෂයේ දෙවන කාර්තුවේ දී මිල මට්ටමේ සිදුවී ඇති ඉහළ යෑම සියයට 7.4 කි.

කොළඹ පාරිභෝගික මිල දර්ශකය (CCPI) (2013=100) 2020 වර්ෂයේ දෙවන කාර්තුවේ දී 134.4 ක් ලෙස වාර්තා වී ඇති අතර එය 2021 වර්ෂයේ දෙවන කාර්තුවේ දී 140.5 ක් ලෙස වාර්තා විය. ඒ අනුව 2020 වර්ෂයේ දෙවන කාර්තුවේ සිට 2021 වර්ෂයේ දෙවන කාර්තුව දක්වා මිල මට්ටමේ සිදුවී ඇති ඉහළ යෑම සියයට 4.5 කි.

**රූප සටහන 3 - තෝරාගත් ආර්ථික කටයුතු කිහිපයක 2019 වර්ෂයේ දෙවන කාර්තුවේ පැවති දළ එකතුකළ අගයට සාපේක්ෂව 2021 වර්ෂයේ දෙවන කාර්තුවේ දළ එකතුකළ අගයේ වර්ධනය**



## 1.1 කෘෂිකාර්මික ආර්ථික කටයුතු

රජය විසින් කෝවිඩ් - 19 වසංගතයේ බලපෑම මධ්‍යයේ වුව ද කෘෂිකාර්මික නිෂ්පාදන කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමට අවසර ලබා දී තිබීම හේතුවෙන් 2021 වර්ෂයේ දෙවන කාර්තුවේ දී "කෘෂිකර්මය,වනද්‍රව්‍ය සහ ධීවර කටයුතු" සමස්තයක් වශයෙන් සියයට 8.1ක සැළකිය යුතු වර්ධනයක් වාර්තා කර ඇති අතර පෙර වර්ෂයේ දෙවන කාර්තුවේ දී මෙහි සියයට 8.2ක පසුබැසීමක් වාර්තා විය. 2021 වර්ෂයේ දෙවන කාර්තුවේ පවත්නා මිල ගණන් යටතේ දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 7.6ක දායකත්වයක් කෘෂිකාර්මික ආර්ථික කටයුතු මගින් ලැබී ඇත.

"ධාන්‍ය වගා කිරීම (වී හැර)" උප ආර්ථික කටයුත්ත 2020 දෙවන කාර්තුවේ දී වාර්තා වූ සියයට 54.0 ක වර්ධනයට සාපේක්ෂව 2021 දෙවන කාර්තුව තුළ දී සියයට 6.6 ක වර්ධනයක් වාර්තා කර ඇත. ප්‍රධාන බෝගවල නිෂ්පාදන වර්ධනයන් සැලකීමේ දී, කුරක්කන් සියයට 27, බඩ ඉරිඟු සියයට 19, උඳු සියයට 64, තල සියයට 81 වශයෙන් වර්ධනය වී ඇත. කෙසේ නමුත්, මුං ඇට, කව්පි, සෝයා බෝංචි, රටකජු වැනි බෝගවල නිෂ්පාදනය පිළිවෙලින් සියයට 6, සියයට 23, සියයට 35 සහ සියයට 31 කින් පහත වැටී ඇත

"වී වගා කිරීම" උප ආර්ථික කටයුත්තේ එකතු කළ අගය, 2020 දෙවැනි  කාර්තුව සමග සැසඳීමේ දී 2021 දෙවැනි කාර්තුවේ දී සියයට 5.1 ක පසුබැස්මක් වාර්තා කර ඇත. 2021 යල කන්නයේ වී නිෂ්පාදන ප්‍රමාණයේ සියයට 5.0 ක පසුබැස්මක් වාර්තා කර ඇත.

වර්ෂයක දෙවන කාර්තුවේ දී "එළවළු වගා කිරීම" උප ආර්ථික කටයුත්තේ නිමැවුම අදාල වර්ෂයේ මහ කන්නයේ මාසයක් සහ යල කන්නයේ මාස දෙකකට අදාල ඇස්වැන්නෙන් සමන්විත වේ. ඒ අනුව 2021 වර්ෂයේ දෙවන කාර්තුවේ දී මෙහි නිෂ්පාදනය ඇස්තමේන්තු කිරීම කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන වගා කළ ඉඩම් ප්‍රමාණය පිළිබඳ දත්ත මත පදනම්ව සිදුකර ඇති අතර ඒ අනුව එහි සඳහන් බොහෝ එළවළු වර්ගයන්හි වගා කළ බිම් ප්‍රමාණය පෙර වර්ෂයේ යල කන්නයට සාපේක්ෂව අඩුවී ඇත. ඊට සමගාමීව බෝහෝ එළවළු වර්ගවල නිෂ්පාදකයාගේ මිල ගණන්හී වැඩිවීමක් ද වාර්තා වී ඇත. ඒ අනුව පවත්නා මිල ගණන් යටතේ මෙහි එකතුතළ අගය සියයට 19.3 ක වැඩිවීමක් වාර්තා කරන නමුත් ස්ථාවර මිල ගණන් යටතේ මෙහි සියයට 4.5ක පසුබැසීමක් වාර්තා වී ඇත.

පොල් වගාව ප්‍රධාන කොට තැඹිලි ද ඇතුලත් "තෙල් සහිත පළතුරු වගා කිරීම" ආර්ථික කටයුත්ත තුලින්,  2021 දෙවෙනි කාර්තුවේ දළ දේශීය නිෂ්පාදිතය සඳහා රුපියල් මිලියන 16,878 ක මූර්ත වටිනාකමක් එකතු කොට ඇත. පසුගිය වසරේ දෙවෙනි කාර්තුවට සාපේක්ෂව එය සියයට 14.0 ක වර්ධනයක් වන අතර සමස්ත දල දේශීය නිෂ්පාදිතයට සියයට 1.0 ක පමණ දායකත්වයක් මෙමගින් ලබා දී  ඇත. තවද පසුගිය වසරේ දෙවෙනි කාර්තුව තුල වාර්තා වූ පොල් ගෙඩියක, නිෂ්පාදකයාගේ මිළ රුපියල් 48.07 ක් වූ අතර 2021 මෙම කාර්තුවේ එම මිළ රුපියල් 61.28 ක් වැනි ඉහළ අගයක් බව වාර්තා කරයි. ඊට අමතරව, පොල් සංවර්ධන අධිකාරිය විසින් ඇස්තමේන්තු කරන ලද මෙම කාර්තුවේ නිෂ්පාදනය ගෙඩි මිලියන 778.43 කි.

**රූප සටහන 4 - කෘෂිකාර්මික ආර්ථික කටයුතු වල වර්ධනයන් 2021 දෙවන කාර්තුව**




"තේ වගා කිරීම" ආර්ථික කටයුත්තේ එකතු කළ අගය, 2020 දෙවැනි කාර්තුවේ දී සියයට 10.1 ක පසුබැස්මක් වාර්තා වූ අතර 2021 දෙවැනි කාර්තුවේ දී සියයට 13.4 ක වර්ධනයක් වාර්තා කර ඇත. 2020 දෙවැනි කාර්තුව හා සැසඳීමේ දී මෙම කාර්තුවේ දී "නිමි තේ" නිෂ්පාදන ප්‍රමාණයෙහි සියයට 13.4 ක වර්ධනයක් වාර්තාවී ඇත. කොළඹ වෙළඳපලේ තේ කිලෝවක සාමාන්‍ය මිළ, 2020 දෙවැනි කාර්තුව හා සැසඳීමේ දී රු. 657.78 සිට රු. 604.25 ක් දක්වා සියයට 8.1 ක පසුබැස්මක් වාර්තාවී වී ඇත. තේ වෙළඳපොලේ සියයට 58.0 ක වැඩිම දායකත්වයක් ලබාදෙන පහතරට තේ නිෂ්පාදන ප්‍රමාණයේ සියයට 12.5 ක වර්ධනයක් මෙම කාර්තුවේ දී වාර්තා කර ඇත.

"රබර් වගා කිරීම" ආර්ථික කටයුත්තේ එකතුකළ අගය මෙන්ම රබර් නිෂ්පාදන ප්‍රමාණය 2021 දෙවැනි කාර්තුවේ දී සියයට 15.7 ක වර්ධනයක් වාර්තාකර ඇති අතර එය 2020 දෙවැනි කාර්තුවේ දී සියයට 11.5 ක පසුබැස්මක් වාර්තා කර ඇත. රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ තොරතුරු වලට අනුව, සකස්කළ රබර් කිලෝග්‍රෑමයක් සඳහා අවශ්‍ය ලේටෙක්ස් ප්‍රමාණයෙහි සාමාන්‍ය මිළ රු. 291.49 සිට රු.549.37 දක්වා සියයට 88.5 කින් 2021 දෙවැනි කාර්තුවේ දී වර්ධනයවී ඇත.

"අනෙකුත් ස්ථාවර බෝග වගා කිරීම" උප ආර්ථික කටයුත්ත පුවක් වගා කිරීම, බුලත් වගා කිරීම, කොට්ට කිලංගු වගා කිරීම, කොස් වගා කිරීම, දෙල් වගා කිරීම සහ රා මැදීම යන ආර්ථික ක්‍රියාකාරකම්වල එකතුවෙන් සමන්විත වේ. 2021 වර්ෂයේ දෙවන කාර්තුවේදී මෙහි සියයට 4.3 ක පසුබැසීමක් වාර්තා වන අතර එහිදි මෙම කාර්තුවේ දී බුලත් අපනයනය කිරීම සියයට 14.0 කින් පමණ අඩුවී ඇත.

'සත්ව නිෂ්පාදන' ක්‍රියාකාරකම කිරි නිෂ්පාදනය, බිත්තර නිෂ්පාදනය, මස් පිණිස සතුන් ඇති කිරීම යනාදියෙන් සමන්විත වේ. මෙ මගින් 2021 දෙවන කාර්තුව තුළ දළ දේශීය නිෂ්පාදිතය සඳහා එකතු කළ අගය ස්ථාවර (2010) මිල ගණන් යටතේ රුපියල් මිලියන 14,712 ක් ලෙස වාර්තා වන අතර එය දළ දේශීය නිෂ්පාදිතයට දක්වන දායකත්වය සියයට 1.0 ක් පමණ වේ. මෙම කාර්තුව තුළ දී සත්ව නිෂ්පාදන ක්‍රියාකාරකම 2020 වර්ෂයේ දෙවන කාර්තුවට සාපේක්ෂව සියයට 18.0 ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කර ඇත. සත්ව නිෂ්පාදන දෙපාර්තමේන්වේ දත්ත වලට අනුව ගවයින් හැර අනෙකුත්

සෑම මස් වර්ගයකම නිෂ්පාදනය මෙම කාර්තුවේ දී වර්ධනයවී ඇත. 2020 දෙවන කාර්තුවට සාපේක්ෂව කිරි නිෂ්පාදනය සියයට 6.6 කින් ද, බිත්තර නිෂ්පාදනය සියයට 23.8 කින් ද 2021 දෙවන කාර්තුවේ දී වර්ධනය වී ඇත.

"වන සම්පත් සහ දැව කඳන් නිෂ්පාදනය" යන ආර්ථික කටයුත්ත තුලින් මෙම කාර්තුවේ දල දේශීය නිෂ්පාදිතයට එකතු කරන ලද මූර්ත වටිනාකම හෙවත් ස්ථාවර මිළ අනුව වටිනාකම රුපියල් මිලියන 11,014 ක් වෙයි. තවද පසුගිය වසරේ දෙවෙනි කාර්තුවට සාපේක්ෂව එය සියයකට 4.2 ක වර්ධනයකි. මෙම ආර්ථික කටයුත්ත තුල ප්‍රධාන දායකත්වය නියෝජනය වන්නේ දර නිෂ්පාදනය හා දැව කඳන් නිමැවුමයි. දර නිෂ්පාදනයේ යම් පහල යාමක් නිරූපණය වීම පොදු ප්‍රවණතාවක් වන බැවින් මෙවරද ඒ තත්ත්වය දක්නට ඇත. ගෘහස්ථ දර පරිභෝජනය හා කර්මාන්ත ආශ්‍රිත දර පරිභෝජනය අඩු වෙමින් තිබේ. පසුගිය වසරේ දෙවෙනි කාර්තුවට සාපේක්ෂව, රාජ්‍ය දැව සංස්ථාව විසින් මෙම කාර්තුවේ තම නිෂ්පාදනය සියයට 37.7 ක වර්ධනයක් වාර්ථා කොට ඇත. කෙසේ මුත් එම දැව පරිමාවට අදාළ ඒකක මිළ, සියයට 23.7 කින් පහල වැටී ඇති බවද එම ආයතනය පෙන්වා දෙයි.

2020 දෙවන කාර්තුවට සාපේක්ෂව 2021 දෙවන කාර්තුවේදී කරදිය මත්ස්‍ය නිෂ්පාදනය ආර්ථික කටයුත්ත එකතුකළ අගය සියයට 24.7 ක ඉහල යෑමක් දක්නට ලැබේ. මෙම ආර්ථික කටයුත්ත 2021 දෙවන කාර්තුවේදී වර්තමාන මිළ අනුව එකතුකළ වටිනාකම රුපියල් මිලියන 33,177 ක් හා ස්ථාවර මිළ අනුව එකතුකළ වටිනාකම රුපියල් මිලියන 17,575 ක් වන අතර දළ ජාතික නිෂ්පාදිතය තුළ සියයට 0.9 ක දායකත්වයක් දරයි. ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ වාර්තා වලට අනුව 2021 දෙවන කාර්තුවේදී, පෙර වසරේ දෙවන කාර්තුවට සාපේක්ෂව කරදිය මත්ස්‍ය නිෂ්පාදනය සියයට 26.0 ක ඉහළයෑමක් පෙන්වයි. වෙරළ කලාප මත්ස්‍ය නිෂ්පාදනය සියයට 16.6 ක ඉහල යෑමක් පෙන්වන අතර ගැඹුරු දිය මත්ස්‍ය නිෂ්පාදනය සියයට 37.2 ක ඉහල යෑමක් පෙන්වයි. 2021 දෙවන කාර්තුවේ කොවිඩ්-19 වසංගත තත්ත්වය සීග්‍ර ලෙස ව්‍යාප්ත වීම හේතුවෙන් ඇතැම් ප්‍රදේශ,පළාත් මුල් කරගනිමින් සංචරණ සීමා, නිරෝධායන ඇදිරි නිතිය පැනවුවද එය සමස්තයක් ලෙස පෙර වර්ෂයේ දෙවන කාර්තුවට සාපේක්ෂව සාමාන්‍ය ජන ක්‍රියාකාරකම් හා ධීවර කර්මාන්තය කෙරෙහි ඇතිකල බලපෑම අල්ප විය. එසේම රජය විසින් ධීවර කර්මාන්තය නිසි පරිදි පවත්වාගෙනයෑමට හා මත්ස්‍ය අස්වැන්න නිසි පරිදි පාරිභෝගිකයන්ට බෙදාහැරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීමට මැදිහත්වීමත් දක්නට ලැබිණි.

නමුත් මෙම අංශය කොවිඩ් 19 වසංගතයට පෙර තිබූ මට්ටමට තවම පැමිණ නැත. එයට මැයි මාසයේදී කොළඹ වරාය ආසන්නයේ X-press Pearl නැව ගිණි ගැනීමෙන් ඇතිවූ බලපෑමද හේතු වී ඇත..

මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය හා ජලජීවී වගාව ආර්ථික කටයුත්ත එකතුකළ වටිනාකම් 2020 දෙවන කාර්තුවට සාපේක්ෂව 2021 දෙවන කාර්තුවේදී සියයට 7.6 ක ඉහලයෑමක් වාර්තා වේ.

## 1.2 කර්මාන්ත ආර්ථික කටයුතු

කර්මාන්ත ආර්ථික කටයුතු 2020 වර්ෂයේ දෙවන කාර්තුවේ දී සියයට 23.1 ක පසුබැසීමක් වාර්තා කරන ලද අතර 2021 වර්ෂයේ දෙවන කාර්තුවේ දී සියයට 22.1 ක ධන වර්ධනයක් වාර්තා කර ඇත. මෙහි එකතුකළ වටිනාකම පවත්නා මිල ගණන් යටතේ රුපියල් මිලියන 217,842 ක් ලෙස වාර්තා වන අතර පවත්නා මිල ගණන් යටතේ 2021 වර්ෂයේ දෙවන කාර්තුවේ දළ දේශීය නිෂ්පාදිතයට සියයට 27.0 ක පමණ දායකත්වයක් ලබාදී ඇත.

සමස්ථ දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 2.3 ක් නියෝජනය කරන "පතල් හා කැනීම්" ආර්ථික කටයුත්ත, 2020 වර්ෂයේ දෙවන කාර්තුව ට සාපේක්ෂව සියයට 7.9 ක වර්ධනයක් මෙම කාර්තුවේ දී අත්පත් කරගෙන ඇත. පතල් හා කැණීම් ආර්ථික කටයුත්ත උප ප්‍රධාන ක්‍රියාකාරකම් තුනක් වන ඉදිකිරීම් අමුද්‍රව්‍ය කැණීම්, මැණික් කැණීම් සහ අනෙකුත් ඛනිජ කැණීම් වලින්

සමන්විත වේ. පතල් හා කැණීම් ආර්ථික කටයුත්තට ඉහළ දායකත්වයක් දරනු ලබන, ඉදිකිරීම් අමුද්‍රව්‍ය කැණීම් උප ආර්ථික කටයුත්ත සියයට 13.5 ක වර්ධනයක් මෙම කාර්තුව තුළ දී අත්පත් කරගෙන ඇත. මැණික් අපනයනය වටිනාකම පසුගිය වසරේ දෙවන කාර්තුව ට සාපේක්ෂව සියයට 442 කින් මෙම කාර්තුව තුළ දී ඉහළ ගොස් ඇත.

**රූපසටහන 4 - කර්මාන්ත ආර්ථික කටයුතු වල වර්ධනයන් 2021 දෙවන කාර්තුව**




## 1.2.1 නිමැවුම කර්මාන්ත කටයුතු

කොවිඩ්-19 වසංගතය 2020 වර්ෂයේ දෙවන කාර්තුවේදී නිෂ්පාදනය කර්මාන්ත අංශයේ කටයුතු කෙරෙහි අහිතකර ලෙස බලපෑ අතර එහිදි නිෂ්පාදන කර්මාන්ත කටයුතු පසුබැසීමක් වාර්තා කරන ලදි . එසේ පසුබැසීමට ලක්වූ නිෂ්පාදන කර්මාන්ත අංශය 2021 වර්ෂයේ දෙවන කාර්තුවේ දී සියයට 26.5 ක සැලකිය යුතු ඉහළ වර්ධනයක් වාර්තා කර ඇත. එහිදි බොහෝ නිෂ්පාදන කර්මාන්ත කටයුතු ඉහළ ධන වර්ධන වේගයන් මෙම කාර්තුවේදී වාර්තා කර ඇත .

මෙම අංශය තුල ඇති විශාලතම ආර්ථික කටයුත්ත වන "ආහාර ද්‍රව්‍ය, බීම වර්ග සහ දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තය" මුළු දළ දේශීය නිෂ්පාදනයට සියයට 5.9 ක දායකත්වයත් සමග සියයට 5.4 වර්ධනයක් 2021 වර්ෂයේ දෙවන කාර්තුවේදී වාර්තා කර ඇති අතර 2020 වර්ෂයේ දෙවන කාර්තුවේදී සියයට 0.3 ක සුළු වර්ධනයක් වාර්තා කර ඇත. නිෂ්පාදන කර්මාන්ත අංශය තුල ඇති දෙවන විශාලතම ආර්ථික කටයුත්ත වන "රෙදිපිළි, ඇඟළුම් හා සම්භාණ්ඩ නිෂ්පාදන" කර්මාන්තය සියයට 60.7 ක සැලකිය යුතු ඉහළ වර්ධනයක් 2021වර්ෂයේ දෙවන කාර්තුවේදී වාර්තා කර ඇති අතර 2020 වර්ෂයේ දෙවන කාර්තුවේදී එය සියයට 42.4 ක පසුබෑමකි.

"දැව හා දැව නිෂ්පාදන හා ලීයෙන් කරන ලද නිෂ්පාදන" (ගෘහ භාණ්ඩ හැර) උප අංශයද 2020 වර්ෂයේ දෙවන කාර්තුවේ දී සියයට 35.4ක පසුබෑමක් වාර්තා කර තිබූ අතර මෙම උප අංශය 2021 වර්ෂයේ එම කාර්තුවේදී සියයට 32.0 කින් වර්ධනය වී අත. 2020 වර්ෂයේ දෙවන කාර්තුවේ දී සියයට 25.4ක පසුබෑමක් වාර්තා කර තිබූ "අඟුරු නිෂ්පාදනය සහ

ඛණිජ තෙල් ද්‍රව්‍ය පිරිපහදුව නිෂ්පාදන" කර්මාන්තය 2021 වර්ෂයේ දෙවන කාර්තුවේ දී සියයට 12.7ක වර්ධනයක් වාර්තා කරයි. ඛනිජ තෙල් පිරිපහදු ප්‍රමාණය සියයට 14.0 කින් ඉහළ යාම මේ සඳහා බලපා ඇත.

2020 වර්ෂයේ දෙවන කාර්තුවේදී "රසායනික නිෂ්පාදන හා මූලික ඖෂධ නිෂ්පාදන කර්මාන්තය සියයට 11.6ක පසුබෑමක් වාර්තා කරයි. මෙම උප අංශය 2021 වර්ෂයේ දෙවන කාර්තුවේදී සාමාන්‍යකරනය වී සියයට 13.0 ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කරයි. කොවිඩ් 19 වසංගතය නිසා ඖෂධ සහ අනෙකු සෞඛ්‍ය නිෂ්පාදන සඳහා පැවති ඉල්ලුම ඉහළ යාමට ප්‍රතිචාර වශයෙනි.

රබර් හා ප්ලාස්ටික් නිෂ්පාදන ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තය සියයට 43.1ක පසුබෑමක් 2020 වර්ෂයේ දෙවන කාර්තුවේදී වාර්තා කරයි . කෙසේ වෙතත් මෙම උප අංශය 2021 වර්ෂයේ දෙවන කාර්තුවේදී සාමාන්‍යකරනය වී සියයට 66.8ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කරයි.

තවද "ගෘහභාණ්ඩ නිෂ්පාදන කර්මාන්තය"(සියයට 54.4) , "අනෙකුත් ලෝහ නොවන ඛනිජ නිෂ්පාදන කර්මාන්තය"(සියයට 41.3), "මූලික ලෝහ වර්ග නිෂ්පාදනය සහ පිරිසකසන ලද ලෝහ නිෂ්පාදන (යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ හැර) කර්මාන්තය" (සියයට 74.5), "කඩදාසි ද්‍රව්‍ය නිෂ්පාදනය, මුද්‍රණය සහ පටිගත කරන ලද මාධ්‍ය නිෂ්පාදන ආදිය(සියයට 28.1), යන්ත්‍ර සූත්‍ර හා උපකරණ ආදිය නිෂ්පාදන කර්මාන්තය"(සියයට 47.8), "වෙනත් නිෂ්පාදන කර්මාන්ත සහ යන්ත්‍රෝපකරණ අළුත්වැඩියාව හා සවිකිරීම"(සියයට 28.1)ක් වශයෙන් ඉහළ වර්ධන වේගයන් 2021 වර්ෂයේ දෙවන කාර්තුවේදී වාර්තා කරයි.

"විදුලිය නිෂ්පාදනය" කර්මාන්තය 2021 වර්ෂයේ දෙවන කාර්තුවේ දී සියයට 12.8 ක ධන වර්ධනයක් වාර්තා කර ඇත. අදාළ කාලපරිච්ඡේදය තුළ මුළු විදුලිබල ජනනය ගිගාවොට් 3,605 සිට ගිගාවොට් 4,073 දක්වා සියයට 13.0 කින් ඉහළ යාමක් වාර්තා වී ඇත. කෙසේ වෙතත් මෙම කාර්තුවේ විදුලිය අලෙවි ආදායම 2020 වර්ෂයේ දෙවන කාර්තුවට සාපේක්ෂව සියයට 1.6කින් පමණක් වර්ධනය වී ඇත. එසේම මෙම කාර්තුව තුළ දී සමස්ත විදුලිබල ජනනයෙන් ජල විදුලිබල ජනනය සහ තාප විදුලිබල, පුනර්ජනනීය විදුලිබල ජනනය අතර අනුපාතය 45:47:08ක් ලෙස සටහන් විය. පෙර වර්ෂයේ දෙවන කාර්තුවේ දී මෙම අනුපාතය 17:78:05 ක් ලෙස සටහන් විය.

2021 වර්ෂයේ දෙවන කාර්තුවේදී "ජලය එක්රැස් කිරීම,පිරිසිදු කිරීම සහ බෙදාහැරීම" යන ආර්ථික කටයුත්ත සියයට 3.2 ක වර්ධනයක් වාර්තා කර ඇත. එහිදී ජලය සැපයුම් ප්‍රමාණය 2020 වර්ෂයේ දෙවන කාර්තුවේ පැවති ඝන මීටර දහස් 195,639 සිට 2021 වර්ෂයේ දෙවන කාර්තුවේ දී ඝන මීටර දහස් 201,787 දක්වා සියයට 3.1 කින් වැඩිවී ඇත. කෙසේ වෙතත් මෙහි මෙහි අලෙවි ආදායම මෙම කාර්තුවේ දී සියයට 14.1 කින් අඩු වී ඇත.

2020 දෙවන කාර්තුවට සාපේක්ෂව 2021 දෙවන කාර්තුවේදී ඉදිකිරීම් කටයුතු සියයට 18.2 කින් ඉහළ ගොස් ඇත. මෙම කාර්තුවේදී සමස්ත දළ දේශීය නිෂ්පාදිතයේ ඉදිකිරීම් ක්‍රියාකාරකම්වල ප්‍රතිශතය සියයට 6.3 ක් ලෙස වාර්තා විය. මෙම කාර්තුවේදී සිමෙන්ති ආනයනය සියයට 11.68 කින් සහ දේශීය සිමෙන්ති නිෂ්පාදනය සියයට 33.83 කින් ඉහළ ගොස් තිබේ. සමස්ත සිමෙන්ති සැපයුම සියයට 24.64 කින් ඉහළ ගොස් තිබේ. එසේම, 2020 දෙවන කාර්තුවට සාපේක්ෂව 2021 දෙවන කාර්තුවේදී ආනයනය කරන ලද ගොඩනැගිලි ද්‍රව්‍යවල වටිනාකම සියයට 61.7 කින් ඉහළ ගොස් තිබේ.

### 1.3 සේවා ආර්ථික කටයුතු

2021 වර්ෂයේ දෙවන කාර්තුවේ දී සේවා ආර්ථික කටයුතු සමස්තයක් වශයෙන් සියයට 7.5 ක ධන වර්ධනයක් වාර්තා කර ඇති අතර පවත්නා මිල ගණන් යටතේ දළ දේශීය නිෂ්පාදිතයට දක්වනු ලබන දායකත්වය සියයට 57.9 ක් පමණ වේ.

මෙමගින් 2021 වර්ෂයේ දෙවන කාර්තුවේ දළ දේශීය නිෂ්පාදිතයට එකතු කෙරෙන වටිනාකම් පවත්නා මිල ගණන් යටතේ රුපියල් මිලියන 2,101,397 ක් වන අතර ස්ථාවර මිල ගණන් යටතේ රුපියල් මිලියන 1,303,929 ක් වේ.

“තොග සහ සිල්ලර වෙළඳාම” 2021 දෙවන කාර්තුවේ දළ දේශීය නිෂ්පාදිතය සඳහා සියයට 13.4ක පමණ දායකත්වයක් ලබා දී ඇති අතර 2020 දෙවන කාර්තු වේ වාර්තා වූ සියයට 1.6ක ඍණ වර්ධනය හා සැසඳීමේදී 2021 දෙවන කාර්තුවේදී සියයට 1.0 ක වර්ධනයක් පෙන්නුම් කරයි. කෝවිඩ් -19 වසංගතයේ තුන්වන රැල්ල අප්‍රේල් මස අග බාගයේ සිට පැතිර ගිය අතර එය 2021දෙවන කාර්තුව පුරා රට තුළ ව්‍යාපාරික කටයුතු හා ජනතාවගේ එදිනෙදා ජීවන කටයුතු කෙරෙහි බලපෑමක් එල්ල කරනු ලැබුවත් තොග හා සිල්ලර වෙළඳ ක්‍රියාකාරකම් මෙම කාර්තුවේදී සියයට 1.0 ක ධනාත්මක වර්ධනයක් වාර්තා කර ඇත.

“තොග හා සිල්ලර වෙළඳාම” යටතේ ආහාර හා ආහාර නොවන අත්‍යවශ්‍ය පාරිභෝගික භාණ්ඩ වෙළඳාම මෙන්ම ඇඳුම්, පාවහන් හා උපාංග, විලාසිතා සහ ආභරණ, ඉලෙක්ට්‍රොනික උපකරණ, ගෘහ භාණ්ඩ හා දිගුකාලීන පරිභෝජන භාණ්ඩ, විනෝදාස්වාදය, නවාතැන් හා නිවාස යනාදි අංශ ද ආවරණය කරයි.
ආනයනවල අඩුවැඩි වීම සහ දේශීය නිෂ්පාදිතයේ අඩුවැඩි වීම තොග හා සිල්ලර වෙළඳාම උප ආර්ථික කටයුත්ත මගින් දළ දේශීය නිෂ්පාදිතයට එකතුකෙරෙන වටිනාකම තීරණය වීමට බලපානු ලැබේ. එබැවින් තොග හා සිල්ලර වෙළඳාම උප ආර්ථික කටයුත්තේ වර්ධන වේගය ආනයන, දේශීය කෘෂිකාර්මික නිෂ්පාදනය සහ දේශීය කාර්මික නිෂ්පාදනය යන විචල්‍යයන්හී වෙනස්වීම මත රඳා පවතී.

ශ්‍රී ලංකා මහ බැංකුවේ (CBSL) බාහිර වෙළඳ සංඛ්‍යාලේඛනවලට අනුව, 2020 දෙවන කාර්තුව සඳහා සමස්ත ආනයන වියදම රු. මිලියන 599,729 වූ අතර 2021 දෙවන කාර්තුව සඳහා එය මිලියන 989,351 දක්වා සියයට 65.0 කින් වැඩිවී ඇත. එසේම, මෙම කාර්තුවේදී පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම 2020 වර්ෂයේ දෙවන කාර්තුවේ පැවති රු. මිලියන 154,399 සිට රු. මිලියන 181,990 දක්වා සියයට 17.9 කින් වැඩිවී ඇත. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද වෙළඳ දර්ශකවලට අනුව, 2020 දෙවන කාර්තුව හා සසඳන විට 2021 දෙවන කාර්තුවේදී පාරිභෝගික භාණ්ඩ ආනයන පරිමා දර්ශකය සියයට 3.0 කින් වැඩිවී ඇති අතර, සමස්ත ආනයන පරිමා දර්ශකය සියයට 37.1 කින් වැඩිවී තිබේ. එසේ ම 2021 දෙවන කාර්තුවේදී කාර්මික නිෂ්පාදනයේ සිදුව ඇති වර්ධනය හේතුවෙන් එහි සමස්ත වෙළඳ ආන්තික වටිනාකම 2020 දෙවන කාර්තුව හා සසඳන විට රු. මිලියන 213,921 සිට රුපියල් මිලියන 303,946 දක්වා සැලකිය යුතු ලෙස සියයට 42.1 කින් වර්ධනය වී තිබේ.

මීට අමතරව, ශ්‍රී ලංකා මහ බැංකුවේ (CBSL) බාහිර වෙළඳ සංඛ්‍යාලේඛනවලට අනුව, 2020 දෙවන කාර්තුව හා සසඳන විට 2021 දෙවන කාර්තුවේදී ලෝකයේ සෙසු රටවල් සඳහා වන මුළු අපනයන වටිනාකම සියයට 63.4 කින් වර්ධනය වී තිබේ. ශ්‍රී ලංකා මහ බැංකුවේ (CBSL) වෙළඳ දර්ශකයන්ට අනුව සමස්ත අපනයන පරිමා දර්ශකය සියයට 55.9 කින් වර්ධනය වී තිබේ. එහිදී කෘෂිකාර්මික අපනයන පරිමා දර්ශකය සහ කාර්මික අපනයන පරිමා දර්ශකය මෙම කාර්තුවේදී පිළිවෙලින් සියයට 8.7කින් සහ සියයට 70.0 කින් වර්ධනය වී ඇත.

“මගීන් සහ භාණ්ඩ ප්‍රවාහන සේවාවන් සහ ගබඩා පහසුකම් සැපයීම” යන සේවා ආර්ථික කටයුත්ත, භාණ්ඩ හා සේවා ගොඩබිම් ප්‍රවාහනය, මුහුදු මාර්ග වල ප්‍රවාහනය සහ ගුවන් සේවාවන් සහ ගබඩා පහසුකම් සැපයීම යන උප ආර්ථික කාර්යයන් ගෙන් සමන්විත වේ. 2021 වර්ෂයේ දෙවන කාර්තුවේ දී ගොඩබිම් ප්‍රවාහන කටයුතු ධන වර්ධනයක් වාර්තා කර ඇති අතර පසුගිය වසරේ දෙවන කාර්තුවට සාපේක්ෂව, සියළුම ගොඩබිම ප්‍රවාහන සේවා මේ සඳහා වැඩි දායකත්වයක් ලබා දී ඇත. මෙම කාර්තුවේ දී ගුවන් ප්‍රවාහනය සහ නාවික ප්‍රවාහනය ද ධන වර්ධන වේගයන් වාර්තා කර ඇති අතර ගබඩා පහසුකම්

සැපයීම සහ අනෙකුත් ප්‍රවාහන සහය සේවා කටයුතු ද ධන වර්ධනයක් වාර්තා කර ඇත. මේ අනුව සමස්තයක් වශයෙන් ප්‍රවාහන කටයුතු 2020 වර්ෂයේ දෙවන කාර්තුවට සාපේක්ෂව 2021 දෙවන කාර්තුවේ දී සියයට 20.4ක ධන වර්ධනයක් වාර්තා කර ඇත.

**රූපසටහන 5 - සේවා ආර්ථික කටයුතු වල වර්ධනයන් 2021 දෙවන කාර්තුව**




2021 වර්ෂයේ දෙවන කාර්තුවේ දී තැපැල් හා කුරියර් සේවා උප ආර්ථික කටයුත්ත සියයට 4.7 ක ධන වර්ධන වේගයක් වාර්තා කර ඇති අතර තැපැල් දෙපාර්තමේන්තුවේ දත්ත වාර්තා අනුව මෙහෙයුම් වියදම් ඉහළ යෑමක් වාර්තා වී ඇත.

2020 දෙවන කාර්තුවේ "නවාතැන්, ආහාර හා පාන වර්ග සැපයීම" ආර්ථික කටයුත්ත, කොරෝනා වසංගතය ගෝලීයව හා දේශීයව ව්‍යාප්ත වීමත් සමඟ දේශීයව පනවන ලද දැඩි සංචරණ සීමා හා රට අගුළු දැමීම නිසා දැඩි පසුබෑමට ලක්විය. (සියයට -63.6).කොවිඩ්-19 වසංගතයේ තෙවන රැල්ල 2021 අප්‍රේල් මස අග භාගයේ ආරම්භ වී 2021 දෙවන කාර්තුව පුරා පැතිරගිය නමුත් "නවාතැන්, ආහාර හා පාන වර්ග සැපයීම" යන ආර්ථික කටයුත්තට සිදු වූ බලපෑම 2020 දෙවන කාර්තුවට සාපේක්ෂව ඉතා අඩු මට්ටමක පැවතුනි.විශේෂයෙන් අප්‍රේල් මාසය දීර්ඝ කලකට පසුව උදාවූ උත්සව සමයක් බැවින් දේශීය සංචාරකයන් විශාල වශයෙන් හෝටල් ආශ්‍රිත සේවාවන් ලබා ගැනීම නිසා හෝටල්වල ආදායම් ඉහල ගිය නමුත් මැයි සහ ජූනි මසවල නැවත සංචරණ සීමා පැනවීම නිසා හෝටල්වල ක්‍රියාකාරකම් සීමාවිය. ශ්‍රී ලංකාවේ කොළඹ කොටස් වෙළඳපොලේ ලියාපදිංචි වී ඇති ලැයිස්තුගත හෝටල් සමාගම්වල කාර්තුමය මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2021 දෙවන කාර්තුව තුළ එම හෝටල්වල කාර්තුමය පිරිවැටුම 2020 දෙවන කාර්තුවේ කාර්තුමය පිරිවැටුම හා සසඳන විට සියයට 160 කින් පමණ වර්ධනය වී තිබේ.නමුත් මෙම පිරිවැටුප 2019 දෙවන කාර්තුවේ රුපියල් මිලියන 6,906 වූ අතර එය 2020 දෙවන කාර්තුවේ රුපියල් මිලියන 1,209 ක් දක්වා අඩුවී ඇති අතර 2021 දෙවන කාර්තුවේ දී රුපියල් මිලියන 3,136 දක්වා වැඩි වී ඇත.

ආහාර හා පාන සැපයීම යන ආර්ථික ක්‍රියාකාරකම් 2020 දෙවන කාර්තුවේදී කොවිඩ් වසංගතය නිසා සම්පූර්ණයෙන්ම අඩාල වී තිබූ නමුත් 2021 දෙවන කාර්තුවේ දී යම් තරමක සක්‍රිය මට්ටමකින් ක්‍රියාත්මක විය.විශේෂයෙන් ආහාර හා පාන වර්ග නිවෙස්වලට බෙදාහැරීමේ ආර්ථික සේවාව ග්‍රාමීය මට්ටම දක්වා ව්‍යාප්තවීමක් දක්නට ලැබුණි.

එබැවින් සමස්තයක් ලෙස 2020 දෙවන කාර්තුවට සාපේක්ෂව 2021 දෙවන කාර්තුවේදී දී "නවාතැන්, ආහාර හා පාන වර්ග සැපයීම"යන ආර්ථික කටයුත්තේ එකතුකළ වටිනාකම සියයට 42.6 කින් විශාල ලෙස වර්ධනය වී ඇත.කෙසේ නමුත් 2019 දෙවන කාර්තුවේ එකතුකළ වටිනාකම රුපියල් මිලියන 34,123 වූ අතර 2020 දෙවන කාර්තුවේ දී එය රුපියල් මිලියන 12,437 දක්වා අඩුවී ඇති අතර 2021 දෙවන කාර්තුවේ දී රුපියල් මිලියන 17,738 දක්වා වැඩි වී ඇත.ඒ අනුව මෙම ආර්ථික කටයුත්ත තවමත් යථාතත්ත්වයට පත්වෙමින් පවතී.

"වැඩසටහන් සකස් කිරීම, විකාශන කාර්යයන්, ශබ්ද පටිගත කිරීම හා වීඩියෝ නිෂ්පාදනය කිරීම" යන සේවා ආර්ථික කාර්යය සියයට 2.8ක වර්ධනයක් 2020 වර්ෂයේ දෙවන කාර්තුවට සාපේක්ෂව 2021 වර්ෂයේ දෙවන කාර්තුවේ දී වාර්තා කර ඇති අතර 2020 වර්ෂයේ දෙවන කාර්තුවේ දී මෙහි සියයට 3.9ක පසුබෑසීමක් වාර්තා වි පැවතිණ.

2020 වර්ෂයේ දෙවන කාර්තුවේ දී "විදුලි සංදේශ සේවා සැපයීම" උප ආර්ථික කටයුත්ත සියයට 16.2ක ධන වර්ධනයක් වාර්තා කරන ලද අතර 2021 වර්ෂයේ දෙවන කාර්තුවේ දී තවදුරටත් සියයට 19.6ක වර්ධනයක් වාර්තා කර ඇත. විශේෂයෙන් පසුගිය කාර්තු පහ පුරාම මෙම ආර්ථික කටයුත්ත ඉහළ වර්ධන වේගයන් වාර්තා කර ඇති අතර ඒ සඳහා කෝවිඩ්-19 වසංගතයේ බලපෑම සමග නිවසේ සිට වැඩකිරීම සහ නිවසේ සිට අන්තර්ජාලය හරහා අධ්‍යාපනය ලබා ගැනීම වැඩි වශයෙන් සිදුවීම බලපා ඇත. 2021 වර්ෂයේ දෙවන කාර්තුවේ දී රැහැන් රහිත ස්ථාවර දුරකථන සම්බන්ධතා සියයට 23.4කින් වැඩිවී ඇති අතර ජංගම දුරකථන සම්බන්ධතා සියයට 4.9කින් වැඩි වී ඇත. තව ද අන්තර්ජාලය සහ ඊ-තැපැල භාවිත කරන සම්බන්ධතා 2010 වර්ෂයේ පැවති මිලියන 0.5 සිට 2021 වර්ෂයේ දෙවන කාර්තුව වන විට එම ප්‍රමාණය මිලියන 20ක් දක්වා වැඩිවී ඇත.

"පරිගණක වැඩසටහන් සම්පාදනය පිළිබඳ උපදේශනය හා සම්බන්ධ කාර්යයන්" යන උප ක්‍රියාකාරකම කොරෝනා වසංගතය මධ්‍යයේ වුවද සැලකිය යුතු ක්‍රියාකාරීත්වයක් 2021 දෙවන කාර්තුවේදී වාර්තා කර ඇත. මෙම ආර්ථික කටයුත්ත එසේ සැලකිය යුතු ධනාත්මක වර්ධන අනුපාතයක් වාර්තා කළ ප්‍රධාන කර්මාන්ත අතරින් එකක් වන අතර එම ප්‍රමාණය සියයට 24.2 කි. මෙම කර්මාන්තයේ බොහෝ සමාගම් වලට නිවසේ සිට වැඩ සංකල්පයෙන් ඔවුන්ගේ වැඩ කරගෙන යාමට හැකිවිය. ශ්‍රී ලංකා මහ බැංකුවේ ගෙවුම් ශේෂ සංඛ්‍යාලේඛන වාර්තා අනුව පරිගණක සේවා සැපයීමෙන් උපයන ලද අපනයන ආදායම සියයට 31.7 කින් මෙම කාර්තුවේදී වැඩි වී ඇත.

'මූල්‍ය සේවා සැපයීම" ආර්ථික කටයුත්ත සඳහා බලපත්‍රලත් වාණිජ බැංකු (එල්සීබී), බලපත්‍රලත් විශේෂිත බැංකු (එල්එස්බී), වෙනත් ලියාපදිංචි මූල්‍ය සමාගම්, ශ්‍රී ලංකා මහ බැංකුව, කොළඹ කොටස් හුවමාරුව (සීඑස්ඊ) සහ ශ්‍රී ලංකාවේ ගෘහ නියෝජනය කරන පුද්ගලයින් විසින් සපයනු ලබන මූල්‍ය ආයතන විසින් සපයනු ලබන ප්‍රධාන සේවාවන්හි දත්ත උපයෝගී කර ගනී. මෙම ආර්ථික කටයුත්ත 2020 දෙවන කාර්තුවට සාපේක්ෂව 2021 දෙවන කාර්තුවේ වර්ධනය සියයට 14.3ක් ලෙස වාර්තා වේ. මෙම කාර්තුවේදී ස්ථාවර මිල ගණන් යටතේ එහි එකතුකළ අගය රුපියල් මිලියන 257,365 ක් වූ අතර එය 2020 කාර්තුවේ වාර්තා වූ රුපියල් මිලියන 225,186 ට වඩා ඉහළ අගයක් ගනී. මූල්‍ය සේවාවන්හි භාවිතාව, ණය සහ අත්තිකාරම් වටිනාකම සහ මුළු තැන්පතු වටිනාකම මගින් පෙන්නුම් කරයි. ඒ අනුව ණය අත්තිකාරම් වටිනාකම සහ මුළු තැන්පතු වටිනාකම 2021 දෙවන කාර්තුවේ පිළිවෙලින් සියයට 16.24 කින් සහ සියයට 21.27කින් වර්ධනය වී ඇත. 2021 දෙවන කාර්තුවේ දී "හරිත සාමාන්‍ය ණය පොලී අනුපාතය" සහ "හරිත සාමාන්‍ය තැන්පතු පොලී අනුපාතය" පිළිවෙලින් සියයට 9.50 ක් සහ සියයට 4.87 ක් ලෙස සටහන් විය.

"රක්ෂණ සේවා සැපයීම සහ විශ්‍රාම වැටුප් අරමුදල් කළමනාකරණය කිරීමේ" කටයුතු වල මූර්ත එකතුකළ අගය 2021 වර්ෂයේ දෙවැනි කාර්තුවේදී සියයට 14.4 ක වර්ධනයක් වාර්තා කර ඇත. මෙම කාලයේදී රක්ෂණ සමාගම් වල සේවක

ගෙවීම් සහ බදු පෙර ලාභයෙහි සියයට 4.2 ක පසුබැස්මක් වාර්තා වී ඇත. රක්ෂණ සේවාව භාවිතය මැන දක්වන උපයන ලද රක්ෂණ වාරික වටිනාකම හා උපයන ලද හිමිකම් වටිනාකමෙහි එකතුව මෙම කාර්තුවේ දී සියයට 21.2 කින් වැඩිවී ඇත. "දේපළ වෙළඳාම් කාර්යයන් (නිවාස අයිතිය ඇතුළත්)" 2020 දෙවන කාර්තුවට සාපේක්ෂව 2021දෙවන කාර්තුවේදී සියයට 5.5 ක වර්ධනයක් පෙන්නුම් කරයි. මෙම ආර්ථික කටයුත්තේ ස්ථාවර මිළ යටතේ එකතු කළ අගය රුපියල් මිලියන 125,510 ක් වන අතර පවත්නා මිල ගණන් යටතේ දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 5.8 ක දායකත්වයක් මෙම ආර්ථික කටයුත්ත මගින් ලබාදෙයි.

"වෘත්තීය සේවා" ආර්ථික කටයුත්ත 2021 වර්ෂයේ දෙවන කාර්තුවේ දී සියයට 3.0ක ධන වර්ධනයක් වාර්තා කර ඇති අතර මූර්ත දළ දේශීය නිෂ්පාදිතයට එකතුකරන ලද වටිනාකම රුපියල් මිලියන 36,802ක් වන අතර පවත්නා මිල ගණන් යටතේ දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 1.7ක දායකත්වයක් ලබා දී ඇත. මෙහි එකතුකළ අගය ගණනය කරනු ලබන්නේ ආර්ථික ක්‍රියාකාරකම් 8 ක එකතුවක් ලෙසිනි. මෙය ප්‍රධාන වශයෙන් " නීති හා ගිණුම් කාර්යයන්", "ගෘහනිර්මාන හා ඉංජිනේරු කාර්යයන්", " විද්‍යාත්මක පර්යේෂණ සහ සංවර්ධන කාර්යයන්" "ප්‍රචාරණ හා අලෙවි පර්යේෂණ, වෙනත් වෘත්තීය, විද්‍යාත්මක හා තාක්ෂණ කාර්යයන්" සහ "ප්‍රකාශන කාර්යයන්", "පශු වෛද්‍ය කාර්යයන්". "කුලී හා බදු කාර්යයන්", "රැකියා, රැකියා නියෝජිත ආයතන, ආරක්ෂක හා විමර්ශණ කාර්යයන්" සහ "ගොඩනැගීම් හා උද්‍යාන සැකසීම සම්බන්ධ සේවා සැපයීම් කාර්යයන්" ගෙන් සමන්විත වේ.

2021 වර්ෂයේ දෙවන කාර්තුවේ දී "සෞඛ්‍ය සේවා සැපයීම" උප සේවා ආර්ථික කටයුත්ත සියයට 4.1ක ධන වර්ධනයක් පෙර වර්ෂයේ දෙවන කාර්තුවට සාපේක්ෂව වාර්තා කර ඇත. විශේෂයෙන් පෞද්ගලික සෞඛ්‍ය සේවා සැපයීම් ප්‍රසාරණය වී ඇති අතර කොළඹ කොටස් හුවමාරුවේ ලියාපදිංචි දිවයිනේ ප්‍රමුඛතම පෞද්ගලික රෝහල් පහක 2021 වර්ෂයේ දෙවන කාර්තුවට අදාල මුල්‍ය වාර්තා විශ්ලේෂණයේ දී ඒවායේ පිරිවැටුම පෙර වර්ෂයේ දෙවන කාර්තුවට සාපේක්ෂව සියයට 85කින් පමණ වැඩිවී ඇති බව නිරීක්ෂණය විය. එසේම ඊ-චැනිලින් සේවා ව භාවිතා කිරීම ද සැළකිය යුතු ලෙස මෙම කාර්තුවේ දී වැඩිවී ඇත.

අනෙකුත් පුද්ගල සේවා කාර්යයන්" දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 7.6 ක දායකත්වයක් සපයන අතර ප්‍රධාන උප ක්‍රියාකාරකම් දෙකකින් සමන්විත වේ. ඒ "කලා හා පොදු විනෝදාත්මක කාර්යයන්" සහ "අනෙකුත් පෞද්ගලික කාර්යයන්" වශයෙනි. ජනතාවගේ සෞඛ්‍ය සුරක්ෂිතතාවය රැකගැනීම සඳහා ක්‍රියාත්මකව පවතින සමාජ දුරස්ථභාවය පවත්වා ගැනීමේ ක්‍රියාමාර්ග හේතුවෙන් මෙම ආර්ථික කටයුත්ත සම්බන්ධව බලපාන සීමාකිරීම් ආර්ථිකය තුළ දිගින් දිගටම පවතින අතර ඒ හේතුවෙන් 2021 වර්ෂයේ දෙවන කාර්තුවේ දී මෙහි වාර්තා වන වර්ධනය සියයට 2.6ක් වේ.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ දැක්ම

දේශීය සංවර්ධන අභිමතාර්ථ සාක්ෂාත් කරගැනීම සඳහා කාලීන තොරතුරු ලබා දීම තුළින් කලාපයේ පෙර ගමන්කරු බවට පත්වීම

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ මෙහෙවර

ගෝලීයකරණ පසුබිමක් තුළ සමෘද්ධිමත් ජාතියක් බවට පත්වීම සඳහා නව තාක්ෂණය, සේවක කැපවීම සහ උපායශීලී නායකත්වය තුළින් කාලීන වූත් නිවැරදි වූත් දත්ත ලබා දීම මගින් වඩාත් ඵලදායී ලෙස දේශයෙහි සමාජ ආර්ථික සංවර්ධනයට දායක වීම

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
සංඛ්‍යාන මන්දිරය
අංක.306/71,පොල්දූව පාර
බත්තරමුල්ල

info@statistics.gov.lk
+94 11 2147000
+94 11 2147011
statistics.gov.lk

මෙය ජාතික ගිණුම් අංශයේ ප්‍රකාශනයකි.
සිව්වන මහල, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
National.accounts@statistics.gov.lk
+94 11 2147071
+94 11 2877938